# සමුපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
## கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
## Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**




| මගේ අංකය / எனது இல / My No. | SP/CEC/1/O/5 | ඔබේ අංකය / உனது இல / Your No. | | දිනය / திகதி / Date | 2023.06.23 |
|---|---|---|---|---|---|

උපදෙස් ලිපි අංක 2023(4)

දකුණු පළාතේ සියලුම සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

**<u>2023 පළාත් පාලන ඡන්ද විමසීමට නාම යෝජනා භාර දුන් දේශපාලන අයිතිවාසිකම් හිමි සමුපකාර සේවකයින් සදහා වැටුප් ගෙවීම හා සහන සැලසීම.</u>**

2023 පළාත් පාලන ඡන්ද විමසීමට නාම යෝජනා භාර දුන් දේශපාලන අයිතිවාසිකම් හිමි සමුපකාර සේවකයින් සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කිරීමට 2023.06.18 දින පැවති කොමිෂන් සභාවේදී තීරණය කර ඇත.

02. 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සදහා අපේක්ෂකයන් ලෙස නාම යෝජනා භාර දී ඇති දේශපාලන අයිතිවාසිකම් හිමි සමුපකාර සේවකයින්ට ,ඔවුන් අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් වී ඇති පළාත් පාලන බල ප්‍රදේශය තුල පිහිටි සේවා ස්ථානයක සේවයේ නිරතව සිටින්නේ නම්,නැවත සේවයට වාර්තා කිරීමට හැකි වන පරිදි සේවයට වාර්තා කිරීම සදහා අවස්ථාව සලසා දීමට අදාල සමිති විසින් ක්‍රියා කළ යුතුය.

03. ඒ අනුව, 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සදහා අපේක්ෂකයන් ලෙස නාම යෝජනා භාර දී ඇති දේශපාලන අයිතිවාසිකම් හිමි සමුපකාර සේවකයින් මේතාක් සේවයට කැදවා නැත්නම් 2023.07.01 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරනු ලබන සේවා ස්ථානයක් වෙත සේවයට වාර්තා කල යුතුය.

04. වෙළඳසැල් කළමණාකරු,ග්‍රාමීය බැංකු කළමණාකරු වැනි ප්‍රාදේශීය ආයතනවල සේවය කරන සේවකයකු නම් අදාල සේවකයා මැතිවරණය සදහා තරග කරන ඡන්ද කොට්ඨාශයද ~~එම~~ එම කොට්ඨාශයම නම් එම කොට්ඨාශයෙන් බාහිර ප්‍රාදේශිකයකට හෝ ග්‍රාමීය බැංකුවකට අනුයුක්ත කිරීමට කටයුතු කිරීම වඩාත් යෝග්‍ය වේ.එමෙන්ම අදාල සේවකයින් තම රාජකාරි පරිශ්‍රය තුල තම දේශපාලන පක්ෂය/කණ්ඩායම ප්‍රවර්ධනය කිරීමට අදාල කටයුතු වලින් වැලකිය යුතු බව තරයේ අවධාරණය කරමි.

05. එසේම, 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සදහා අපේක්ෂකයන් ලෙස නාම යෝජනා භාර දී ඇති දේශපාලන අයිතිවාසිකම් හිමි දැනට වැටුප් රහිත නිවාඩු මත සිටින සමුපකාර සේවකයින්ට,2023.03.09 දින සිට 2023.04.25 දින තෙක් වූ කාලය වැටුප් සහිත නිවාඩු ලෙස සලකා සේවකයාට හිමි මූලික වැටුප ගෙවීමට කටයුතු කල යුතුය.

06. මෙම විධිවිධානය 2023 පළාත් පාලන ඡන්ද විමසීමට පමණක් අදාල වේ.

කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ජයන්ත ජී. ලියනගේ
ලේකම් (වැ.බ.)
සමුපකාර සේවක කොමිෂන් සභාව
දකුණු පළාත

ජයන්ත ජී. ලියනගේ.
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව
දකුණු පළාත.

පිටපත -1. ලේකම්, කෘෂි,ගොවිජන සංවර්ධන .. සමු. අමාත්‍යාංශය - දැ.ගැ.ස.

2. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්, දකුණු පළාත - කරු.සමු.සං.ප්‍රා.නි. හරහා අදාල සමිති දැනුවත් කිරීම සඳහා

3. දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුවට


ලේකම් / செயலாளர் / Secretary — 091-2232794
පරිපාලන නිලධාරි / நிர்வாக அதிகாரி / Administrative Officer — 091-2234279
කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax — 091-2234383
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site — www.cec.sp.gov.lk
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail — empcommicoopsp@sltnet.lk